

# විසිවස පුරන්නීය, අද තරංගා



*සාකච්ඡාකර සකස්කළේ*

**සිසිර දිසානායක**

වැසුණා දොර පියන් අතරින් මියුරු සංගීතයකි කාන්දුවන්නේ. දෙසවන් එය විඳින රිසියෙන් සිත් සතන් ශ්‍රවණායටම යොමු කරවා ගනියි. සියල්ල අමතක වූවා සේය සිතට. සැබැවින්ම දොරපියන් හරින්නේ කවදා ද ?

ඒ ඔක්තොම්බර් එකොලොස්වන දා යි. හරියටම හවස 6.00 ට ඒ දොර පියන් හැරෙන්නේ රෝ විල් සෙකන්ඩරි විද්‍යාලයේ පර්ෆෝමිං ආර්ට් තියටර් ශාලාවේයි. අවුරුදු විස්සක් තිස්සේ රසික, ශ්‍රාවක, ප්‍රේක්ෂකයින්ට හැරුණ දොරපියන් මෙවර හැරෙන්නේ විසිවසරක අභිමානවත් ගමනක ස්වර්ණමය පියසටහන තැබෙන ස්වර්ණමය දෙහෝරාව වෙනුවෙන්. සිය විසි වස සපුරන "තරංගා" වාදක කණ්ඩායමේ "තරංගා මියැසි සැඳෑව" ප්‍රසංගය පැවැත්වෙන දවසට සිත පියාඹා ගිහින්.... දොර පියන් අතරින් වැහුණ සංගීතය හිටිවනම නැවතී පියඹා ගිය ඒ සිත ආපසු කැඳවා ගත්තා. නැවතුන මියැසිය කෙළවර හැරුනේ කැමරන් කොළඹගේ සංගීතවේදියාගේ නිවසේ පුහුණුවීම් කෙරෙන කුටියේ දොර පියන්.

"කොහොමද සිසිර ? හුගක් වෙලාද ඇවිත් ?" කැමරන් සිය ප්‍රතාපවත් දෙකොපුල විහිදා සිනාසුනා. විවර වූන දොර පියන් අතරින් එළියට පැනගත්තේ භද්‍ර යෞවනයේ පසුවන දරු දැරිවියන් කීප පළක්. දීර්ඝ පුහුණුවක නිමාවේ බලාපොරොත්තු විය හැකි විඩාබර මුහුණු වෙනුවට ඔවුන්ගෙන් දිස්වූයේ ප්‍රබෝධමත් සිනාවෙන් එළිය වුණු මුහුණු. "තරංගා" සංගීත ආශ්‍රමයේ සිසු සිසුවියන් වැනි ඔවුන් මේ සිනහ මුහුණින් එළිපෙහෙළියට බසින්නේ දහසකුත් එකක් වූ ප්‍රාර්ථනාවන්ගෙන් සපිරි මතු දිනයකට නොවේ ද ? ඒ ප්‍රේක්ෂක, ශ්‍රාවක, රසිකයින්ගේ ද ප්‍රාර්ථනාවන් ම නොවේ ද? ඊට එක්වුණ මුහුකුරා ගිය අද්දැකීමෙන් යුක්ත වූ දෙතුන් පළක් ද නොවූවා නොවේ. සියල්ල අගේට මුහු වී ඇති බවකි හැඟෙන්නේ.

"මං මගේ වචනවලින් ම කියන්නම්" මුලින්ම කැමරන් අපගේ කතාවට ප්‍රවිෂ්ඨය සැපයූවා.

"අපි මේ සංගීත වැඩේ පටන් ගත්තේ කැලිප්සෝ කණ්ඩායම විදියට. දන්නවානේ බතික් සරම් ඇඳගෙන පන් කොළ තොප්පි එහෙම දාගෙන වාදනය කර කර සින්දු කියන විදිය.? ලංකාවේ අපේ යාළුවෝ එකතු කරගෙන මුලින්ම සෙල්ලම් කළේ මීගමුවේ. බිලූ ඕෂන්ස්, බ්‍රවුන්ස් බීච් වගේ හෝටල්වල. මම වැඩ කළෙත් බ්‍රවින්ස් එකේනෙ. හවසට හවසට කොල්ලො කට්ටියත් එක්ක විනෝදෙට වගේ පටන් ගත්තේ."

පසු කාලෙක කොළඹ "පයනියර්ස්" කණ්ඩායමේ රිදම් ගිටාරය වැයීමට ලද අවස්ථාවක් එහිදී ම "බේස්" ගිටාරය වැයීමට යොමු වූ අන්දත් කැමරන් විස්තර කළා.

මම මීගමුවෙ නම් දරාපු "සන්ෂයින්" කණ්ඩායමටත් සෙල්ලම් කළා. ඒත් අසූ තුනේ කෝලාහලවලින් පස්සෙ හෝටල්වලට ලැබුවෙ නරක කාලයක්. ඒ නිසා මම ආයිමත් කොළඹ ආවා. මගේ තාත්තා ඉස්සර මොහොමඩ් සාලි, පැට්‍රික් දෙනිපිටිය වගේ අය එක්ක සෙල්ලම් කරලා තිබුණා.

කැමරන්ගෙ පියා අවිස්සාවේල්ල ප්‍රදේශයේ වෙසෙන දක්ෂ වාදන ශිල්පියෙක්. ඔහු වඩාත් අපරදිග භාණ්ඩවලටයි නැඹුරුව. මොහොමඩ් සාලි සංගීතවේදියාගේ පැරණි මධුර තනු නිර්මාණ පිළිබඳව ලිවීමට මෙහි ඉඩවෙන් කළ යුතු නෑ. පැට්‍රික් දෙනිපිටිය සුනිල් ශාන්තයන්ගේ ඇසුරින් බිහිව සී. ටී. ප්‍රනාන්දු වැනි ගායන ශිල්පීන් අනුව සිය වැදන කුසලතා දැක්වූ ශිල්පියෙක්.

"දවසක් පැට්‍රික් අයියා කතා කළා ජාතික රූපවාහිනියේ පස්වෙනි සංවත්සරය වෙනුවෙන් කරපු වැඩසටහනක "බේස් ගිටාර්" එක සෙල්ලම් කරන්න. ඉතින් එදා ඉඳන් අසූ හතේ මෙහාට එනකල්ම මම ඒ අයත් එක්ක හිටියා. මම ආසම කරන දවස තමයි පී.එල්.ඒ. සෝමපාල, චිත්‍රා සෝමපාල දෙපොළගේ විසි පස්වෙනි සංවත්සරයට කොළඹ ලයනල් වෙන්ඩ්ට් ශාලාවේ තිබුණ ප්‍රසංගය."

"මම අවුරුදු දාසයේ ඉඳන් මේ සංගීත වැඩ කළේ. ඒත් මෙහෙ ආව දවස්වල හිතිලා තිබුණා දැන් ඇති කියලා. මම වැඩ කරපු "නිෂාන්" එකේමයි තුසිතත් වැඩ කළේ. ඒ එකතු වෙලා තමයි අපි දෙන්නා පොඩි පොඩි දේවල්වලට සහභාගි වුණේ."

තුසිත කුලසේකර මෙල්බර්න් නුවර වෙසෙන දක්ෂ සර පුවරු වාද්‍ය ශිල්පියෙක්. ඉන්ද්‍රාණි පෙරේරා සහ ඇනස්ලි මාලේවනගේ ප්‍රසංගයක් වෙනුවෙන් තමා තනිව සංගීතය සපයමින් තිබිණි. නුවර ගිය අන්දමින් ආනන්ද විද්‍යාලයේ හිටපු සංගීත ආචාර්යවරයෙකු වූ රංජිත් මධුරප්පෙරුම වෙ වාද්‍ය ශිල්පියා එහිදී හමු වූ අන්දමත්, සිසිර ඉන්ද්‍රානි සේනාරත්න යුවලගේ ප්‍රසංගය වෙනුවෙන් තමාට ආරාධනා කළ අන්දම පිළිබඳව කැමරන් සිය මතකය අවදි කළා.

"මම තුසිතටත් කතා කළා. සිඩ්නි යන්න. එතකොට තුසිත තමයි "මචං තවත් හොඳ දෙන්නෙක් ඉන්නවා" කියලා නාලකවයි රෝහිතවයි එක්ක ආවේ." නාලක වීරකෝන් සිතාරයෙන් ද, රෝහිත උඩුවෙල තබ්ලාවෙන් ද "තරංගා" මියැසි තරංගයන්ට එක්වූයේ එලෙසින්.

"දිලිනි ආවා ඒ දවස්වල මගෙන් "කී බෝඩ්" එක ඉගෙන ගන්න. ඉතින් මම ඒ දුවවත් සම්බන්ධ කර ගත්තා; මොකද එයා දක්ෂ නිසා. අපි ළමයි ටිකක් පුහුණු කළා ? ඒ අතර හිටපු වීණා, නවීන්, කණිෂ්ක දූලා පුතාලාත් දැන් අපිත් එක්ක ඉන්නවා."

කැමරන් සිහිපත් කරන වික්ටර් රත්නායකයන්ගේ "ස" ප්‍රසංගය මෙල්බර්න් නුවරුන්ට අලුත් අත්දැකීමක් වුණා. උපා උපදාස, රෝහණ කරුණාරත්න වැනි අයගේ මූලිකත්වයෙන් සංවිධානය වුණ ප්‍රසංගයේ ගීත දෙකකට ම වාදනයෙන් සහය වුනේ කුඩා දූ දරුවන් පිරිසක්. "මෙල්බර්න් පුරවර යොවුන් මියැසි කැළ" වාදනය කළ අන්දමට පහන් වූ සිතින් රත්නායකයන්ගේ නෙතග කඳුලක් නැංවුණා.

"එදා වික්ටර් රත්නායක මහත්මයා මාව අගේ කිරීම මගේ ජීවිතයේදී මා ලබපු ලොකුම ආශිර්වාදය වුණා. දිලිනි ප්‍රනාන්දු සර පුවරුවෙනුත්, වීණා කෑඳුරගම බටනලාවෙනුත්, නවීන් ගුලවිට වයලීනයෙනුත්, කණිෂ්ක කරුණාරත්න ගිටාරයෙනුත් අද "තරංගා" මියැසි තරංග අතරට එක්වෙලා.

"මුලින් ම එකතු වුණ අපි හතරදෙනා වැඩ කළේ සහෝදරයො හතරදෙනෙක් වගේ. වැඩ රාජකාරි නිසා විටින් විට එහා මෙහා වුණත් ඒ සහෝදරකම් අදටත් එහෙමමයි. මේ පොඩි කට්ටිය එක්කත් වැඩ කරන එක හරිම ලේසියි. හරියට ඉස්කෝලෙ වාගේ. කියන පුහුණුවීම් වැඩ ටික ගෙදර වැඩ කරනවා වාගේ කරගෙන එනවා. වෙලාවට වැඩ. ඒ විනය මට ලොකු හයියක්."

මම දැනට තරංගා කණ්ඩායමට එකතුවෙලා අවුරුදු පහක් හයක් වෙනවා. ඒ ඉෂාන් බෙග් ශිල්පියාගේ ප්‍රසංගයකින්." ඉංග්‍රීසි බසින් අප හා එක් වුණෙ දිලිනි. "මුල් කාලයේ දී කැමරන් අංකල් මට ගොඩක් උපදෙස් දුන්නා. දැන්නම් ඒ තරම්ම අංකල් මත රැඳෙන්න ඕන නෑ වගේ. අළුත් ගීතවලට හුරුවෙන්න මුලදි අමාරු වුණා. සමහර වෙලාවට වාදන භාණ්ඩ දෙකක තුනක කොටස් සර පුවරුවෙන් වාදනය කරන්න වෙනවා. ඒත් ඉතින් පුහුණු වුණාම අමාරුවක් නෑ" දිලිනි පැවසුවා.

"මම 60-65% විතර මූලික වාදන කොටස් ඒ ඒ භාණ්ඩ වාදනය කරන අයට සටහන් හදලා කියලා දෙනවා. ඉතුරු හරිය එයාලමයි අහලා සටහන් හදාගන්නේ." කැමරන් ඊට ආයෙත් එක්වුණා.

"අපි සංගත තැටි අහලා අපිට පුළුවන් හැටියට අපිම ඒ ඉතිරි කොටස් ලියාගන්නවා. ඇත්තටම අපි අපේ අත්දැකීම, දැනුම බෙදාග න්නෙ හරි විනෝදයෙන් කණ්ඩායමේ ගොඩක් දෙනා තරුණ අයනෙ..." දිලිනි සිනාසුනා. ඇය වයස අවුරුදු හතේ පටන් "ක්ලැසිකල් පියානෝ" පාඨමාලා හදාරා අටවන ශ්‍රේණියේ සුදුසුකම් ලද්දියක්. මූලික පියානෝ පාඨමාලා ඉගැන්වීමට ද ඇය සුදුසුකම් ලබා තියෙනවා.

"නවය වසරෙදි තමයි මට විද්‍යාලයේ තූර්යවාදක කණ්ඩයමත් එක්ක වාදනය කරන්න ඉගෙන ගත්තේ. විභාගවලට පෙනීහිටින තරමට මම හැදෑරුවේ නෑ වගේම මම තනිවම වාදනය කරලා තිබුණොත් නෑ." ඒ වීණාගේ මුල පිරීම. ඇයගේ භාණ්ඩටය බටනලාව.

"ඇත්තටම මම වාදනය කරන්නේ ලෝහමය නලාවක්. බටවලින් හදපු එකකට වඩා හඬ වෙනස් ටිකක්. මම උත්සාහ කළා ඒ හඬම ගන්න. ඒත් අමාරුයි; මොකද එකකට එකක් වෙනස් නිසා. මම තනිකරම ස්වර සටහන් උදව්වෙන් ඉගෙන ගන්නවාය කිව්වොත් නිවැරදියි. හදලා දෙන ස්වර සටහන් එක්ක මම ගීතයට සවන් දෙනවා. ඒ දෙකම ආශ්‍රයෙන් මගේ ම සටහනක් මම පිළියෙල කරගන්නවා. ඒකයි මගේ ක්‍රමය. මම සිංහල සින්දු දන්නෙ නැති නිසා කලින් අහලා නැති සින්දු පුරුදු වෙන්නෙ ඔය විදියට."

"ලංකාවෙන් එන ශිල්පීන් හැමෝම මටනම් හොඳවුණා. ඒ අය පුදුම වෙනවා අපි ගැන. ඒ වගේම සතුටු වෙනවා ඒ අපි තරුණ අය නිසා වෙන්න ඇති." වීණා සිනාසුනාය.

"ලේඩිස් ෆස්ට් කියනවනෙ..." අපේ කතාවට නවීන් දෑස්කොට සිනාසුනේ බොහොම අහිංසක විදියට.

"මමත් සිංහල ගීත වාදනය කරන්න පටන්ගත්තෙ "ස" ප්‍රසංග යෙන්. මුලින් ම අපි ඒක ගීතයකටයි සූදානම් වුනේ. පස්සෙ තව ගීතයක් එක්වුණා. අපි මාස දෙකක් තුනක් පුහුණු වුණා. ඇත්තටම මමත් පටන් ගත්තෙ පියානෝ එකෙන්. ඒ වයස අවුරුදු හයේදී විතර. මම ඒ විභාග ඔක්කොම සම්පූර්ණ කළා. ඒ වයස අවුරුදු හතේ දී විතර. දැනටත් මම වයලින් එක බටහිර ක්‍රමයට පාසලේදී ඉගෙන ගන්නවා.

"මට සිංහල තේරුණේ නැතිවුණත් ඒ සින්දු අහපුවම ඒ සංගීතයෙන් කියවෙන හැඟීම් තේරුම් ගන්න පුළුවන්. ඒ හැඟීමෙන් තමයි මම වයලීන් එක වාදනය කරන්නෙ කැමරන් අංකල් "කී බෝඩ්" එකෙන් හරි ගිටාර් එකෙන් හරි කියලා දෙන දේ මම කනින් අහලා වාදනය කරන්න ඕන. හරියටම හරි දේ එනකල් එයා මාව පුහුණු කරනවා. බාගෙට බාගයක් වගේ ස්වර සටහන් වලින් වගේම කනට ඇහෙන දෙයින් තමයි කෙරෙන්නෙ. ඇත්තටම "තරංගා" එක්ක එකතු වෙන්න ලැබුණ එක අනර්ඝ අවස්ථාවක් අපි වගේ අයට." නවීන් කිව්වේත් අනික් දෙන්නා වගේම ඉංග්‍රීසියෙන්.

"කොල්ලා හොඳට අත බර කරලා වයලින් එක ගහනවා. දිගටම කරගෙන ගියොත් හොඳ අනාගතයක් තියෙනවා කියලා දවසක් රෝහණ කිව්වා. කැමරන් හඬ අවදි කළා. රෝහණ කියලා කැමරන් මේ කිව්වේ ප්‍රවීණ සංවේදී රෝහණ වීරසිංහයන් ගැන. මේ හැමෝම වෙලාව ගලපාගෙන කළමණාකරනය කරගන්න හැටි කිව්වෙ අනික්

34 වන පිටුවට